# ත්‍රිපිටක සූත්‍රාගත ග්‍රන්ථවිඥාපන ලක්ෂණ පිළිබඳ විමසීමක්

වැවල ධම්මාලෝක හිමි

## 1. හැඳින්වීම

බුදුන් වහන්සේ විසින් දේශනා කළ ධර්මය අනාගත පරපුරේ ප්‍රයෝජනය සඳහා ආරක්ෂා කොට තැබීම ප්‍රථම සංගායනාවේ ප්‍රධාන අරමුණක් විය. එහි දී සංගීතිකාරක තෙරුන්වහන්සේ බුද්ධ දේශනා හඳුනාගැනීම, එක්රැස් කිරීම, තහවුරු කිරීම, සංවිධානය කිරීම, වර්ගීකරණය හා සූත්‍රානුගත කිරීම වැනි ක්‍රමවේද භාවිත කොට ඇති බව පැහැදිලිව දක්නට ලැබේ. බුද්ධ දේශනාව නිවැරදි හා සාධිකාරී දැනුම් සම්භාරයක් ලෙස පවත්වා ගැනීමට මෙවැනි ක්‍රම හේතු විය. ත්‍රිපිටකාගත සූත්‍රවල විශේෂ ලක්ෂණ විමසා බැලීමෙන් පැහැදිලි වන්නේ ඒවායේ ග්‍රන්ථවිඥාපන ලක්ෂණ මැනවින් අන්තර්ගත වන බවයි.

බුද්ධ දේශනා සංවිධානය කිරීමේ දී සූත්‍ර ක්‍රමය භාවිත කිරීමේ පදනම පැහැදිලි කොට ඇත. ඒ අනුව ධර්ම කරුණු කිසිවක් අදාළ සන්දර්භයෙන් ගිලිහී යාමට ඉඩ නො තබා හුයකින් මෙන් බැඳීම සූත්‍ර ක්‍රමය මඟින් සිදු කෙරිණි (දීඝනිකාය ටීකා, 1967, පි.19) (සමන්තපාසාදිකා, 2009, පි.19). සූත්‍ර ක්‍රමය නිසා බුද්ධ දේශනාව කට පාඩම් කිරීම හා ධාරණය කිරීම පහසු විය. බුද්ධ දේශනා එකිනෙක වෙන් කොට හඳුනා ගැනීමට හා එම දේශනා වර්ගීකරණය කිරීම සඳහා සූත්‍ර ආකෘතිය උපකාරක විය. මේ තුළ නිතැතින්ම බුද්ධ දේශනාව සංවිධානය කිරීමෙහිලා ග්‍රන්ථවිඥාපන ක්‍රම අනුගමනය කිරීමේ පදනමක් ඇති විය.

නූතන පුස්තකාලවල දැනුම සංවිධාන ක්‍රම පිළිබඳ විමසීමේ දී වර්ගීකරණයට හා සූචිකරණයට ප්‍රධානත්වය හිමි වේ. ත්‍රිපිටකයේ සූත්‍ර ආකෘතියේ ග්‍රන්ථවිඥාපන ලක්ෂණ ගණනාවක් අන්තර්ගත වන බව පෙනේ. මෙම සූත්‍රාගත ලක්ෂණ නූතන සූචිකරණ සම්ප්‍රදායයන්හි ඇතුළත් ග්‍රන්ථවිඥාපන ලක්ෂණ සමඟ තුලනාත්මක ලෙස විමසා



බැලිය හැකිය. ත්‍රිපිටකාගත සූත්‍රවල ග්‍රන්ථවිඥාපන ලක්ෂණ විමසා බැලීම කෙරෙහි පුස්තකාලවේදීන්ගේ හෝ වෙනත් බෞද්ධ වියතුන්ගේ හෝ සැලකිල්ල ප්‍රමාණවත් ලෙස යොමු වී නැති බව පෙනේ (අබේරත්න, 2002). මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ ත්‍රිපිටකයේ සූත්‍ර ආකෘතිය විශ්ලේෂණය කොට එහි ග්‍රන්ථවිඥාපන ලක්ෂණ පිළිබඳ විමසීමක් කිරීම යි. වර්තමාන බටහිර දැනුම සංවිධානය පිළිබඳ අදහස්වලට බොහෝ පෙර කල පැරණි භික්ෂු සම්ප්‍රදායේ පැවති ග්‍රන්ථවිඥාපනය පිළිබඳ දැනුම හඳුනා ගැනීමට මෙම අධ්‍යයනය ප්‍රයෝජනවත් විය. ත්‍රිපිටකාගත ග්‍රන්ථ හා තදනුබද්ධ පාලි අට්ඨකතා මෙන් ම සූචිකරණය පිළිබඳ නූතන ග්‍රන්ථ හා වෙනත් ප්‍රාමාණික බෞද්ධ ග්‍රන්ථ කිහිපයක් මෙම අධ්‍යයනයේ දී තොරතුරු මූලාශ්‍රය වශයෙන් භාවිත කරන ලදී. වර්තමාන මුද්‍රිත ත්‍රිපිටකය, අටුවා හා තදනුබද්ධ බෞද්ධ ග්‍රන්ථ සඳහා සූචි සම්පාදනය කිරීමේ දී හා ඒවා උපැහැරණ කොට දැක්වීමේ දී අතීත ග්‍රන්ථවිඥාපන ක්‍රම භාවිතය පිළිබඳ මෙම හැදෑරීම මාර්ගෝපදේශයක් විය හැකි ය.

## 2. ග්‍රන්ථවිඥාපන සම්ප්‍රදාය

ග්‍රන්ථවිඥාපනය (Bibliography) යනුවෙන් අදහස් කෙරෙන්නේ කෘතියක අන්තර්ගතය හා භෞතික ස්වභාවය පිළිබඳ උපයෝජකයා වෙත ඉදිරිපත් කරන ප්‍රමිතගත තොරතුරු හෝ දත්ත ප්‍රමාණයකි. ප්‍රලේඛනයක ඇතුළත් කර්තෘ, ග්‍රන්ථනාමය, සංස්කරණය, ප්‍රකාශනය, භෞතික ලක්ෂණ ආදී විස්තර ග්‍රන්ථවිඥාපන විස්තර (bibliographic description) ලෙස හඳුන්වනු ලැබේ. එම විස්තර ඇතුළත් කොට සකස් කරන ග්‍රන්ථවිඥාපන වාර්තාව සූචි පත්‍රයක් ලෙස හැඳින්වේ (Suraj, 2005, p.106).

ග්‍රන්ථවිඥාපන සම්ප්‍රදාය පිළිබඳ ඉතිහාසය අධ්‍යයනයේ දී සූචිකරණ නීති පිළිබඳ අදහස් ඉදිරිපත් කළ විසි වන සියවසේ පුස්තකාලවේදීන් කීපදෙනෙකු කැපී පෙනේ. චාල්ස් ඒ. කටර් (Cutter, 1904), එස්. ආර්. රංගනාදන් (Ranganathan, 1955) සහ සීමන් ලුබෙට්ස්කි (Lubetzky, 1969) සූචිකරණ සම්ප්‍රදාය විධිමත් ලෙස ලොවට

හඳුන්වා දුන් කීර්තිමත් ග්‍රන්ථවිඥාපනවේදීහු වෙති. 1961 දී පැරිසියේ දී පවත්වන ලද සූචිකරණ මූලධර්ම පිළිබඳ ජාත්‍යන්තර සමුලුව ලොව බොහෝ රටවල පුස්තකාලවල ප්‍රමිතගත සූචිකරණ සම්ප්‍රදායක් ආර ම්භ කිරීමට පදනම විය (ICCP,1963).

ග්‍රන්ථවිඥාපන සේවය පිළිබඳ සාකච්ඡාවේ දී සූචිකරණ සම් ප්‍රදායේ ඉදිරිපත් කරන ලද අදහස් වැදගත් වේ. කෘතියක ඇති ග්‍රන්ථ විද්‍යාත්මක ලක්‍ෂණවල වැදගත්කම මේ අදහස්වලින් ඉස්මතු වේ. කටර් විසින් සූචිකරණයේ අරමුණු කිහිපයක් ඉදිරිපත් කොට ඇතः 1. කෘතියක් කර්තෘගේ නමින් හෝ ග්‍රන්ථ නාමයෙන් හෝ විෂය නාමයෙන් සොයා ගැනීමට උපකාර කිරීම 2. කතුවරයෙකුට හෝ විෂයකට හෝ අයත් කිනම් පොත් පත් පුස්තකාලයේ තිබේ ද යන්න හෙළිදරව් කිරීම සහ 3. කෘතියක් සංස්කරණය හෝ සාහිත්‍ය වර්ගය අනුව හඳුනා ගැනීමට උපකාර කිරීම ලෙස ඒවා සැකෙවින් දැක්වේ (Kumar, 1989, p.295). පාඨකයා තම ප්‍රලේඛනය විස්තර කර දීම, අදාළ ප්‍රලේඛනය සොයා දීම, ඔහුගේ අරමුණ ඉටු කිරීම හෙවත් කාලය ඉතිරි කිරීම හා පුස්තකාල සේවකයන්ගේ කාලය ආරක්‍ෂා කිරීම යන කරුණු සූචියේ අරමුණු ලෙස රංගනාදන් ඉදිරිපත් කරයි (Ranganathan, 1964, p.77). ග්‍රන්ථවිඥාපන ක්‍රම මඟින් තොරතුරු සංවිධානය කරනු ලබන්නේ ඒවා කාර්යක්‍ෂම ලෙස භාවිතයට ගැනීම ට ඉඩ සැලැස්වීම පිණිස ය. වර්ගීකරණය මඟින් ප්‍රලේඛන තාර්කික පිළිවෙළක් අනුව ස්ථානගත කෙරෙන අතර සූචියේ කාර්යය වන්නේ එසේ ස්ථානගත කරන ලද ප්‍රලේඛන විස්තර කිරීමෙන් හා විවිධ ප්‍රවේශ මාර්ග ඔස්සේ අදාළ ප්‍රලේඛනය සොයා ගැනීමට උප යෝජක යාට උපකාර කිරීම යි (Gandhi, 1995, p.2). තොරතුරු මාධ්‍ය ස්ව රූප, ගවේෂණ ක්‍රම, තාක්‍ෂණික උපකරණ හා උපයෝජ කයාගේ පුරුදු ආදිය කලින් කල වෙනස් වීම නිසා ග්‍රන්ථවිඥාපන ක්‍රම ද පරි ණාමයට හසු වී ඇත.

ග්‍රන්ථවිඥාපන සම්ප්‍රදායේ නව ප්‍රවණතාව වන්නේ තොරතුරු මූලාශ්‍රය විස්තර කිරීම හා ප්‍රවේශන (Resourse Description and Access) පිළිබඳ විග්‍රහයයි (*Functional Requirements for Bibliogra*



*phic Records*, 1998). මේ විග්‍රහය අනුව සූචියේ අරමුණු හා කාර්ය ලෙස සෙවීම (to find), හඳුනා ගැනීම (to identify), තේරීම (to select). අත්කර ගැනීම (to acquire) හා යාත්‍රා කිරීම (to navigate) දක්වා ඇත. ගතිලක්‍ෂණ භාවිත කොට කිසියම් ග්‍රන්ථවිඥාපන මූලාශ්‍ර යක් සොයා ගැනීම, සමාන ගති ලක්‍ෂණ ඇති මූලාශ්‍රයන් අතරින් අදාළ මූලාශ්‍රය වෙන් කර හඳුනා ගැනීම, උපයෝජකයාගේ අවශ්‍යතා වට ගැළපෙන මූලාශ්‍රය තෝරා ගැනීම, විස්තර කරන ලද ප්‍රලේඛනය අත්පත් කර ගැනීම හා සූචිය හා ඉන් ඔබ්බට ගවේෂණය ඉදිරියට දියත් කිරීම යන ක්‍රියාවලීන් මෙම අරමුණු තුළ අර්ථවත් වී ඇත.

"තොරතුරු මූලාශ්‍රය විස්තර කිරීම හා ප්‍රවේශන" පිළිබඳ සංකල්පය ත්‍රිපිටකාගත ග්‍රන්ථ විඥාපනය තුළ ද යම් ආකාරයකට ඉදිරිපත් වී ඇත. උපයෝජකයාට ත්‍රිපිටකයේ සූත්‍රයක් සොයා ගැනීමට හා හඳුනා ගැනීමට හේතුවන විස්තර ප්‍රමාණයක් ඒ තුළ අන්තර්ගත වේ. සූත්‍රයේ නම, සූත්‍රය දේශනා කළ තැනැත්තා, සූත්‍රය අසන ලද ශ්‍රාවකයා, දේශනා කළ ස්ථානය හා අවස්ථා පිළිබඳ විස්තර මෙහි දී දැකගත හැකිය. මේ ලක්‍ෂණ ත්‍රිපිටකාගත සූත්‍ර හඳුනා ගැනීමේ ප්‍රධාන සාධක වේ. සංගායනා අවස්ථාවේ දී බුද්ධ දේශනා එකිනෙක වෙන් කර හඳුනා ගන්නා ලද්දේ කෙසේද යන්න විමසා බැලීමෙන් මේ කරුණ පැහැදිලි වේ. බුද්ධ දේශනාවක් තවත් එවැනි ම දේශනාවකින් වෙන් කොට දැක්වීම සිදු කළ හැකි වන්නේ සූත්‍රවල ඇතුළත් ග්‍රන්ථ විඥාපන ලක්‍ෂණ අනුවයි. සූත්‍ර වර්ගීකරණය තුළින් එවා ක්‍රමානුකූලව ස්ථාන ගත කිරීම සිදු විය. මේ මගින් සූත්‍රය තිබෙන ස්ථානය කිසියම් භික්‍ෂුවකට නිශ්චය කරගත හැකි වේ. ධර්ම දේශනාවල දී අසුවල් නිකායේ අසුවල් නිපාතයේ අසුවල් වග්ගයේ අසුවල් සූත්‍රය වශයෙන් සූත්‍ර උපුටා දැක්වීමේ පුරුද්දක් භික්‍ෂූන් කෙරෙහි පිහිටා තිබේ. ඒ අනුව උන්වහන්සේලා දේශනාව සඳහා සූත්‍ර තෝරා ගැනීමක් පහසු වෙන් සිදු කරන ලදී. ත්‍රිපිටකය කටපාඩම් කිරීම වශයෙන් පැවති අතීතයේ සූත්‍රයක් ලබා ගැනීම පහසු කාර්යයක් නොවීය. වාග් සම් ප්‍රදායේ මූලාශ්‍රය කියවීම, රැගෙන යාම, පිටපත් කිරීම කියා දෙයක් නො වී ය. එහි දී අවශ්‍යතාව ඇති භික්‍ෂුව අදාළ ධර්ම කොට්ඨාසය ධාරණය කළ භාණක තෙරුන් වෙත ගොස් කටපාඩම් කර ගැනීමෙන් එම සූත්‍රය ලබා ගැනීමට ක්‍රියා කළ යුතු විය.

භික්ෂුවකට තම අවශ්‍යතාව සඳහා කිසියම් සූත්‍රයක් සොයා ගැනීම, හඳුනා ගැනීම, තෝරා ගැනීම හා අයත් කර ගැනීම පහසු වන ආකාරයේ ග්‍රන්ථවිඥාපන ක්‍රමයක් ත්‍රිපිටකයේ අන්තර්ගත වී ඇත. එබැවින් සංගීතිකාරකයන් වහන්සේලා බුද්ධ ධර්මය ක්‍රමවත්ව භාවිතයට ගත හැකි වන පරිදි සංග්‍රහ කිරීමේ දී සූචිකරණය පිළිබඳ අවබෝධයකින් යුතුව ක්‍රියා කළ බව පැවැසීම සහේතුකය (අබේරත්න, 2002, පි.123).

### 3. බුද්ධ දේශනාව සංවිධානය කිරීම

පළමු සංගායනාවේ වැදගත් කාර්ය වූයේ ශ්‍රාවකයන් විසින් බුදුන් වහන්සේගෙන් අසා දැන තිබූ දේශනා සියල්ල හඳුනා ගැනීම හා එක්රැස් කිරීමයි. බුද්ධ දේශනාවේ වැදගත් ප්‍රභේද පිළිබඳ දැන සිටි උන්වහන්සේලා පළමුව විනය දේශනාවත් දෙවනුව සූත්‍රාදී දේශනාත් සංගායනා කළහ (වජිරඤාණ හිමි, 2000, පි.5). මේ ධර්ම කොට්ඨාශ පිළිබඳ බුදුරදුන්ගෙන් අසා දැන සිටි තෙරුන් අතර උපාලි හා ආනන්ද යන තෙරවරුන් සුවිශේෂ විය. උන්වහන්සේලාගේ ප්‍රකාශ බුද්ධ වචනයේ ප්‍රාමාණික දේශනා ලෙස සම්මුතියක් ඇති කර ගැනීම මෙම සංගායනාවේ දී සිදු වූ බව පෙනේ.

බුදුන් වහන්සේගේ විනය පිළිබඳ විෂය විමසීමට උපාලි තෙරුන් ද ධර්ම පිළිබඳ විෂය විමසීමට ආනන්ද තෙරුන් ද තෝරා පත්කර ගන්නා ලද්දේ උන්වහන්සේලා තුළ පැවති විශේෂ සුදුසුකම් අනුවයි. උන්වහන්සේලාගෙන් එක් එක් පිටකය පිළිබඳ තෝරාගත් මාතෘකා අනුව ප්‍රශ්න විමසීම සිදු කරන ලද්දේ මහා කාශ්‍යප තෙරුන් විසිනි. මෙහි දී මහා කාශ්‍යප තෙරුන් විසින් උපාලි තෙරුන්ගෙන් විනය පිළිබඳ විමසීමට අවසර ගත් ආකාරය චුල්ලවග්ගපාළියේ පඤ්චසතිකක්ඛන්ධකයේ සඳහන් වේ: ඒ "සුනාතු මේ ආවුසො සංඝො, යදි සංඝස්ස පත්තකල්ලං අහං උපාලි විනයං පුච්ඡෙය්‍යං" යනුවෙනි. විනය සංගායනා කිරීමට සුදුසු කාලය වන බවත් ඒ සඳහා උපාලි ස්ථවිරයන්ගෙන් විනය විමසන බවත් මහා කාශ්‍යප තෙරණුවෝ දැන්වූහ. (චන්දවිමල හිමි, 2008). අනතුරුව උන්වහන්සේ මහා කාශ්‍යප තෙරුන් විසින් අසන ප්‍රශ්න අනුව විනය විස්තර කරන බව



මෙසේ දැන්වූහ. "සුනාතු මේ භන්තෙ සංඝො, යදි සංඝස්ස පත්තකල්ලං අහං ආයස්මතා මහාකස්සපෙන විනයං පුට්ඨො විස්සජ්ජෙය්‍යං". එතැන් සිට උපාලි තෙරණුවෝ හුනස්නෙන් නැගී භික්ෂූන් වැඳ විජිනිපත ගෙන ධර්මාසනයේ වැඩ සිටිමින් මහා කාශ්‍යප තෙරුන් විමසන ප්‍රශ්න අනුව විනය පිටකය දේනා කළහ. මෙම ප්‍රකාශවලින් සංගායනාවට සිදු විය හැකි බාධා දුරු කිරීමත් විනයේ සාධිකාරීත්වය තහවුරු කිරීමත් වෙනත් මතයක් ඉදිරිපත් වීමට ඇති ප්‍රවේශයන් වළකා සම්මුතියක් ඇති කිරීමත් ප්‍රකට වේ.

### 4. පුච්ඡා-විසර්ජන ක්‍රමය

මෙම සංගායනාවේ පළමු කාර්ය වූයේ ධර්ම විනය හඳුනා ගැනීම යි. ඒ සඳහා භාවිත කරන ලද ක්‍රමවේදය වූයේ ප්‍රශ්න ඇසීම හා විසඳීම නමැති ක්‍රමයයි. එම ප්‍රශ්න ඇසීම සඳහා විශේෂයෙන් තෝරා ගන්නා ලද මාතෘකා කිහිපයක් විය. මෙම මාතෘකා බොහෝ දුරට ග්‍රන්ථවිඥාපන ස්වභාවයක් උසුලයි. විනය පිටකය සංවිධානය කිරීමේ දී විනය ශික්ෂා පදයක් පිළිබඳ ප්‍රශ්න හතක් විසඳන ලද බව සමන්තපාසාදිකා බාහිර නිදානයේ සඳහන් වේ. එයින් පළමුව විමසන ලද්දේ කිසියම් නීතියක් හෝ ශික්ෂා පදයක් පනවන ලද ස්ථානය පිළිබඳ ප්‍රශ්නය යි. නිදසුනක් ලෙස මහා කාශ්‍යප තෙරුන් විසින් උපාලි තෙරුන්ගෙන් "උපාලි ආයුෂ්මත්නි, භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රථම පාරාජිකාව කොතැනදී පණවන ලද ද?" යන පැනය විමසන ලදී. එයට පිළිතුරු වශයෙන් උපාලි තෙරණුවෝ "ස්වාමිනී, විශාලා මහනුවර දී යැයි" පැවසූහ. දෙවනුව අසන ලද්දේ අදාළ ශික්ෂාපදය පැනවීමට හේතුවූ තැනැත්තා පිළිබඳව යි. එහි දී මහා කාශ්‍යප තෙරුන් විසින් "පළමු පාරාජිකාව කවරෙකු අරබයා පණවන ලදදැයි" අසන ලදී. උපාලි තෙරණුවෝ "කලන්දක පුත්ත සුදින්න අරබයා "යැයි ඊට පිළිතුරු දුන්හ. තෙවනුව ශික්ෂා පදය පැනවීමේ කරුණ විමසන ලදී. එනම්, "කවරක් නිමිති කොට දැයි" යන්නයි. ඊට උපාලි තෙරණුවෝ "මෙවුන් දම් නිමිති කොට" යැයි පිළිතුරු දුන්හ (සමන්තපාසාදිකා1, 2009, පි.14). මේ ආකාරයෙන් එක් එක් ශික්ෂා පදය පිළිබඳ විස්තර වෙන වෙන ම සම්පූර්ණ කිරීම සඳහා ප්‍රශ්න හතක් විසඳන ලද බව සඳහන්වේ. එම මාතෘකා හත වස්තු, නිදාන,

පුද්ගල, ප්‍රඥප්ති, අනුප්‍රඥප්ති, ආපත්ති, අනාපත්ති යනුවෙන් දක්වා ඇත (චුල්ලවග්ග පාළි 2, 2005, පි.548).

මෙම සංගායනාවේ දී විනය ශික්ෂා පද මාතෘකා වශයෙන් විමසන ලද බැවින් විනයට "මාතිකා" යැයි තවත් නාමයක් වේ (කඞ්ඛාවිතරණී, 2009, පි.xi). එසේම ශික්ෂා පද විභාග කොට දැක් වූ බැවින් "විභංග" යැයි ද පැවසේ. එහෙත් ශික්ෂා පදයක් විභාග කිරීමේ දී කෙතරම් මාතෘකා ප්‍රමාණයක් යොදා ගෙන තිබේ ද යන්න නිශ්චිතව කිව නො හැක. විනය ශික්ෂා පද විග්‍රහ කිරීමේ දී යොදා ගන්නා ලද මාතිකාවලිය පරිවාර පාළියෙහි ද දක්නට ලැබේ.

කෙසේ වුවත් ශික්ෂා පද පිළිබඳ මෙම මාතෘකාමය විශ්ලේෂණ ක්‍රමය නිසා ඒවා වර්ගීකරණය කොට කාණ්ඩ වශයෙන් ඉදිරිපත් කිරීමට හැකි විය. සංගායනා කරන ලද ශික්ෂා පද සියල්ල මහා විභංගය හා භික්ෂුණී විභංගය යැයි ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වන ලදී. උභතෝ විභංග (මහා විභංගය හා භික්ෂුණී විභංගය) කොටසින් අනතුරුව ඛන්ධක සහ පරිවාර වශයෙන් බෙදා දක්වා ඇති ග්‍රන්ථ සමගින් විනය පිටකය සම්පූර්ණ වේ (මහාවග්ග පාළි1, 2005, පි.xli).

### 5. සප්තවිධ මාතෘකා

චුල්වග්ග පාළියේ සප්තවිධ මාතෘකා පිළිබඳ විමසා බැලීමෙන් ත්‍රිපිටකාගත ග්‍රන්ථවිඥාපනය කෙබඳුදැයි හඳුනා ගැනීමට ආලෝකයක් වැටේ. ශික්ෂා පදයක් විමසීමේ දී භාවිත කරන ලද "වත්ථු" යන මාතෘකාවෙන් කියැවෙන්නේ අදාළ වරද සිදු කළ භික්ෂුවගේ අරමුණ නොහොත් විෂය පිළිබඳව යි. නිදසුනක් ලෙස ප්‍රථම පාරාජිකා ශික්ෂාපදයේ වස්තුව වන්නේ මෛථුන ධර්මය යි. එය ප්‍රථම පාරාජිකාවෙහි විෂය ද වේ. ශික්ෂා පදයේ "නිදානය" නම් ප්‍රඥප්තිය පැණවූ ස්ථානය යි. ප්‍රථම පාරාජිකාවේ නිදානය වේසාලිය නම් ස්ථානය යි. මෙසේ ශික්ෂා පද පැණවීමට නිදාන ස්ථාන හතක් දක්වා ඇත. ඒ ස්ථාන නම් වේසාලි, රජගහ, සාවත්ථි, ආලවි, කොසම්බි, සක්ක, භග්ග වශයෙනි (සමන්තපාසාදිකා3, 2009, පි. 298). "පුද්ගල" යනු යම්



ශික්ෂා පදයක් කවරෙකු අරබයා පණවන ලද්දේ ද යන්න යි. නිදසුනක් ලෙස ප්‍රථම පාරාජිකා ශික්ෂා පදය පැණවීමට හේතු වූ පුද්ගලයා ලෙස සුදින්න නම් භික්ෂුවගේ නම දැක්වේ.

"ප්‍රඥප්ති" නම් බුදුන් වහන්සේ විසින් පණවන ලද විනය ශික්ෂා පදය යි. ශික්ෂා පදයක පැණවීම් අවස්ථා කිහිපයක් තිබිය හැක. බුදුන් වහන්සේ කාලය, දේශය, සමාජීය හා ආර්ථිකය ආදී හේතු මත ද වරද කරන පුද්ගලයන්ගේ අභිමතය ද සලකා විටින් විට ශික්ෂා පද සංශෝධනය කළහ. එහෙත් වැදගත් කරුණ වන්නේ උන්වහන්සේ විසින් පණවන ලද ශික්ෂා පදයක් සංශෝධනය කිරීමට හෝ වෙනස් කිරීමට නිදහසක් ශ්‍රාවකයන්ට ලබා නොදීම යි. සංගායනාවේ දී සිදු කරන ලද එක් කාර්යයක් වූයේ ප්‍රස්තුතයකට අදාළ වන ශික්ෂා පදයක හා එහි සංස්කරණවල පෙළගැස්වීමක් සිදු කිරීම යි. නිදසුනක් ලෙස බුදුන් වහන්සේ විසින් ප්‍රථම පාරාජිකා ශික්ෂා පදය පැණවීමෙන් පසු අවස්ථා දෙකක දී සංස්කරණය කරන ලදී. පළමු වන පැණවීම මූල ප්‍රඥප්ති නම් වේ. ප්‍රථම පැනවීමෙන් පසුව භික්ෂුව වෙනත් ආකාරයකින් එකී වරදට යොමුවූ අවස්ථා ඇත්තේ නම් මූල පඤ්ඤත්තිය සංස්කරණය කරමින් දෙවන ප්‍රඥප්තියක් පණවනු ලැබේ. මේ ආකාරයට ශික්ෂා පදයක් පැණවීම් අවස්ථා අනුව පඤ්ඤත්ති ගණන ද තීරණය වේ. "ආපත්ති" යනු වරදට පත් පුද්ගලයන් වර්ග කොට දක්වීම යි. මෙයින් කිසියම් භික්ෂුවක් වරදට හසු වී ද නො වී ද නො එසේ නම් වරද සංඝාදිසේසාදී වෙනත් වරදකින් වෙන් කොට හඳුනා ගන්නේ කෙසේ ද යන්න පවසනු ලැබේ. "අනාපත්ති" නම් අදාළ වරදට හසු නො වන අවස්ථා ය.

කංඛාවිතරණී නම් වූ ප්‍රාතිමෝක්ෂ සංවර්ණනාවේ සඳහන් පරිදි ශික්ෂා පදයක් සම්බන්ධව සංගායනාවේ දී විමසන ලද මාතෘකා රාශියක් ඇති බව පෙනේ. ශික්ෂා පදයන් සඳහා සතළොස් ආකාර සාධාරණ ලක්ෂණ ඇති බවත් නුවණැත්තන් විසින් ඒවා සුදුසු පරිදි යොදා ගන්නා බවත් එහි දක්වනු ලැබේ. සමන්තපාසාදිකා පරිවාර පාළි සංවර්ණනාවේ මහා විභංගයෙහි ශික්ෂා පද විමසනු ලබන සොළොස්වාර ක්‍රමයක් ද භික්ෂුණී විභංගයේ සොළොස්වාර ක්‍රමයක් ද බැගින් දෙතිස්වාරයක් ඇති බව සඳහන් වේ (සමන්තපාසාදිකා3,

2009, පි.297). නිදාන, පුද්ගල, වස්තු, ප්‍රඥප්තිවිධි, ආණත්ති, ආපත්ති, අනාපත්ති, විපත්ති, අංග, සමුට්ඨානවිධි, ක්‍රියා සංඥා චිත්ත යන මේවායින් ඇති වන විවිධත්වය, වජ්ජකම්ම ප්‍රභේදය සහ ත්‍රිකද්වය විධිය යනුවෙන් එම ලක්ෂණ හඳුන්වා තිබේ (කඞ්ඛාවිතරණී, 2009, පි.30). පරිවාර පාළියෙහි ද විනය ශික්ෂා පද විස්තර කොට ඇත්තේ ද මෙම සොළසාකාර මාතෘකා යටතේ ය (පරිවාරපාළි1, 2005, පි.3). විනය පිටකයේ සෑම ශික්ෂා පදයක් ම පරිවාර පාළිය තුළ ඉහත දැක්වූ මාතෘකා යටතේ සම්පාදනය කොට ඇති බැවින් එය විනය පිටකයේ සූචියක් ලෙස හැඳින්වේ.

ධර්මය විමසීමේ නිදහස බුදුන් වහන්සේ තම ශ්‍රාවකයින්හට ද ලබා දුන්හ. මේ නිසා ධර්මය දේශනා කිරීමට හා පරීක්ෂා කිරීමට ශ්‍රාවකයින්ට නිදහසක් තිබිණි. එහෙත් එවැනි නිදහසක් විනය ශික්ෂා සම්බන්ධව ක්‍රියාත්මක නො වී ය. විනය ශික්ෂා පද පැණවීම හා වෙනස් කිරීම පිළිබඳ ඒකමතික අයිතිය බුදුන් වහන්සේ සතු විය (අබේනායක, 1983, පි.10). මේ නිසා බුදුන් වහන්සේ විසින් පණවන ලද විනය ප්‍රඥප්තිවල සංඛ්‍යාවෙහි හෝ ස්වරූපයෙහි වෙනසක් එදාමෙදාතුර සිදු නො වූ බව පිළිගැනේ. විවිධ නිකායන් හා සම්ප්‍රදායන් දහ අටකට අයත් ප්‍රාතිමෝක්ෂයන් සන්සන්දනාත්මකව අධ්‍යයනය කිරීමේ දී පෙනී ගොස් ඇත්තේ එම නිකායන්හි පිළිගෙන ඇති ශික්ෂා පද සංඛ්‍යාවල හා ශික්ෂා පද වර්ගවල සැලකිය යුතු වෙනසක් නොමැති බව යි (භික්ෂු ප්‍රාතිමෝක්ෂය 2007), පි.xiii). විනය දේශනාවේ සර්වකාලීන අගය ආරක්ෂා කිරීම සඳහා මෙවැනි ග්‍රන්ථ විඥාපන ක්‍රම ඉතා වැදගත් බව පැහැදිලි ය. ශික්ෂා පද මෙකී නත් වැදෑරුම් මාතෘකා අනුව සංලේඛගත කිරීම නිසා ශික්ෂා පදවල අර්ථ වත් භාවයත් ආරක්ෂාවත් තහවුරු විය. විනය ගැටලු විසඳීමේ දී, වරද තහවුරු කිරීමේ දී, දඬුවම් නියම කිරීමේ දී හා නිදහස් කිරීමේ දී ශික්ෂා පදයක අදාළ සියලු මාතෘකා විමසා බැලීමට සිදු වේ. ඒ සඳහා ග්‍රන්ථ විඥාපන වශයෙන් සංවිධානය කරන ලද නීති සංග්‍රයක් ලෙස විනය පිටකය හඳුනාගත හැකිය.



### 6. සූත්‍ර සංග්‍රහ කිරීම

සූත්‍ර පිටකයේ ඇතුළත් එක් එක් ධර්ම කොට්ඨාස සූත්‍ර නාමයෙන් හඳුන්වනු ලැබේ. සූත්‍ර පිටකය සම්පාදනය කිරීමට පදනම් වූයේ ආනන්ද තෙරුන් වහන්සේගේ විග්‍රහයයි. මෙහි දී මහා කාශ්‍යප තෙරුන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රශ්නවලට ආනන්ද තෙරුන් පිළිතුරු දුන් ආකාරය දීඝනිකාය අට්ඨකතාවේ දැක්වේ (2008, පි.15).

මහාකාශ්‍යප තෙරුන් : ආනන්ද ආයුෂ්මතුනි, භාග්‍යවතුන් වහන්සේ විසින් බ්‍රහ්මජාල සූත්‍රය කොතැන දී වදාරණ ලද ද?

ආනන්ද තෙරුන් : ස්වාමීනි, රජගහ නුවරටත් නාලන්දා වටත් අතර අම්බලට්ඨිකා නම් රාජගෘහයේ දී ය.

මහා කාශ්‍යප තෙරුන් : කවරක්හු අරබයා වදාරණ ලද ද?
ආනන්ද තෙරුන් : සුප්පිය පරිව්‍රාජක හා බ්‍රහ්මදත්ත මාණවක අරබයා ය.

මහා කාශ්‍යප තෙරුන් : කිනම් කරුණක දී ද?
ආනන්ද තෙරුන් : වර්ණ අවර්ණ කරුණෙහි දී ය.

සුලුවග්ගෙහි පඤ්චසතිකක්ඛන්ධකයේ සඳහන් වන ආකාරයට මහා කාශ්‍යප තෙරණුවෝ ආනන්ද තෙරුන්ගෙන් ප්‍රධාන වශයෙන් සූත්‍රයක් පිළිබඳ නිදාන, පුද්ගල හා හේතු යන මාතෘකා තුන විමසූහ. මේ මාතෘකා විසඳීම් වශයෙන් ආනන්ද තෙරුන් විසින් පස් නිකායන්හි ම සූත්‍ර සම්පාදනය කරන ලද බව චුල්ලවග්ගපාළියේ සඳහන්වේ (2, 2005, පි.550).

සූත්‍ර පිටකයේ ඇතුළත් සූත්‍රයක ආකෘතිය විග්‍රහ කිරීමෙන් එම සූත්‍රය සංග්‍රහ කිරීමට සංගීතිකාරකයන් විසින් භාවිත කළ මාතෘකා හෙවත් ප්‍රශ්නාවලිය හඳුනාගත හැකි ය. සාමාන්‍යයෙන් සූත්‍රයක ආරම්භයක්, මධ්‍ය අවස්ථාවක් හා අවසානයක් පැහැදිලිව දක්නට ලැබේ. මෙම අවස්ථා තුනේ දී භාවිත ක්‍රමවේද කිහිපයක් ඇත. ඒ අනුව සූත්‍රයක ආරම්භයේ දී නිදානය ද මධ්‍යයේ දී ධර්ම කරුණු ද අවසා

නයේ දී සූත්‍ර දේශනාවේ ප්‍රතිඵල ද සාකච්ඡා කෙරෙයි. සූත්‍ර ආකෘතියේ ඇති විශේෂ ලක්‍ෂණ පිළිබඳ විමසා බැලීමෙන් එහි ග්‍රන්ථ විඥාපන ලක්‍ෂණ කවරේද යන්න හෙළි කළ හැකි ය.

## 7. නිදානය

සූත්‍රාංගයක් වශයෙන් නිදානය ඉතා වැදගත් වේ. බුදුන් වහන්සේගේ සෑම දේශනාවක් ම හා ශික්‍ෂා පදයක් ම නිදානය මුල් කොට පවතී. දේශනාවක් නම් එය කවරෙකුට කොතැනක දී කවර අවස්ථාවක කුමක් අරබයා සිදු කරන ලද්දක් ද, විනයක් නම් එය කවරෙකුට කොතැනක දී කවර අවස්ථාවක කුමක් අරබයා පණවන ලද්දක් ද යන්න නිදානයේ විස්තර කරනු ලබයි. නිදානය දැක්වීම සූත්‍ර හා විනය පිටකවල පොදු ලක්‍ෂණයකි. සමහර අවස්ථාවල අටුවාචාර්යයන් විසින් වඩාත් උත්කර්ෂවත් ලෙස නිදානය ඉදිරිපත් කරනු ලැබ තිබේ. ධර්ම කරුණු යටපත් කොට නිදාන කථා උපුටා ගෙන විසිතුරු කොට ඉදිරිපත් කොට ඇති අවස්ථා බෞද්ධ සාහිත්‍යයේ දක්නට ලැබේ. ජාතකට්ඨකථා හා ධම්මපදට්ඨකථා වැනි පාලි ග්‍රන්ථ සඳහා ද ජාතක කතා, සද්ධර්මරත්නාවලී හා පූජාවලී වැනි සිංහල සාහිත්‍ය කෘති සඳහා ද මූලාශ්‍රය වී ඇත්තේ ත්‍රිපිටකාගත නිදාන කතා ය.

සූත්‍රාගත නිදානය කොටස් කිහිපයකට බෙදේ. කාල, දෙස, දෙසක, වත්ථු, පරිසා, අපදෙස යන මාතෘකා නිදායනට අයත් වේ (දීඝනිකායට්ඨකතා1, 2008, පි.54). ඒ අතර දේශනා සම්පත්තිය, ශ්‍රාවක සම්පත්තිය, කාල සම්පත්තිය හා දේශක සම්පත්තිය යනුවෙන් දක්වන මාතෘකා තුන අටුවාවල විස්තර වේ. ආනන්ද හිමියන්ගේ ප්‍රකාශයක් වූන සෑම සූත්‍රයක ආරම්භයේ එන "එවං මේ සුතං...." යනාදී පාඨය නිදානය ලෙස අටුවාවල දැක්වේ. අටුවා මතය අනුව "එවං" යන්නෙන් දේශනා සම්පත්තියත් "මේ සුතං" යන්නෙන් ශ්‍රාවක සම්පත්තියත් "එකං සමයං" යනුවෙන් කාල සම්පත්තියත් "භගවා" යනුවෙන් දේශක සම්පත්තියත් දක්වනු ලැබේ. (මජ්ඣිම - නිකායට්ඨකථා 1, 2008, පි.16). "එවං මේ සුතං" යන සූත්‍ර ප්‍රාරම්භක පාඨයෙන් එම සූත්‍රය බුදුන් වහන්සේ එය දේශනා කරනු ලබන අවස්ථාවේ



ශ්‍රාවක පිරිස අතර සිටි ආනන්ද තෙරුන් විසින් ස්වකීය කනින් අසන ලද බව කියැවේ. ශ්‍රාවකයා විසින් බුදුන් වදාළ ධර්මය තුන් ආකාරයකින් ඇසූ බැව් පෙළෙහි එන නිදසුන් වලින් පැහැදිලි වේ (ප්‍රඥාසාර හිමි, 1961, පි.16). ඒ තුන් ආකාරයෙන් ඇසූ ධර්මය ආනන්ද තෙරුන් විසින් දක්වා ඇත්තේ එකිනෙකට වෙනස් ප්‍රාරම්භක පාඨ තුනකින් ය. එනම්: "සම්මුඛා මේ සුතං", "එවං මේ සුතං" සහ " ඉති මේ සුතං" යනාදී වශයෙනි.

බුදුන් හමුවෙහි නැතිනම් ඉදිරියෙහි උන්වහන්සේ අසලින් ම සිට ආනන්ද තෙරුන් විසින් අසන ලද ධර්මය "සම්මුඛා මේ සුතං" ආදී නයින් දක්වා ඇත. බුදුන් වහන්සේ අභිමුඛයේ දී වරක් ආනන්ද තෙරුන් විසින් අසන ලද ආශ්චර්ය අද්භූත ධර්ම කාරණා දහ නවයක් සම්මුඛා සුත ධර්ම වශයෙන් තබන ලදී (මජ්ඣිම නිකාය 3, 2005, පි.288). "සම්මුඛා මෙතං භන්තෙ, භගවතො සුතං, සම්මුඛා පටිග්ගහිතං" යනුවෙන් ආනන්ද තෙරුන් බුදුන් වහන්සේගේ යම් දේශනාවක් උන්වහන්සේ හමුවේ දී ම අසන ලද ද පිළිගන්නා ලද ද එය ඒ අකාරයේ පාඨයකින් සංගායනාවේ දී ප්‍රකාශ කරන ලදී. කිසියම් දේශනාවක් ශ්‍රාවක පිරිස අතර සිට හෝ ඈතින් සිට අසන ලද නම් එය ''එවං මේ සුතං" යන ප්‍රාරම්භක පාඨයෙන් දක්වන ලදී. එසේ ම සමහර බුද්ධ දේශනාවක් ආනන්ද තෙරුන් විසින් අසන ලද්දේ තවත් කෙනෙකුගේ මාර්ගයෙනි. එවැනි දේශනා "වුත්තං හෙතං භගවා, වුත්තමරහාති මේ සුතං" යනුවෙන් ඉදිරිපත් කොට ඇත. ශ්‍රාවකයා ත්‍රිවිධ ආකාරයකින් බුද්ධ වචනය ශ්‍රවණය කර ඇති බව මෙයින් පෙන්වා දෙනු ලබයි.

## 8. ශ්‍රාවක සම්පත්තිය

බුදුන්වහන්සේගේ දේශනා මැනවින් ඇසූවන් පිළිබඳ විස්තරය ශ්‍රාවක සම්පත්තිය නම් වේ. මෙම දේශනා ඇසූ ශ්‍රාවකයන් අතර ආනන්ද තෙරුන් ප්‍රමුඛ වේ. "එවං මේ සුතං" යන ප්‍රකාශයෙන් ආනන්ද හිමියෝ තමන් විසින් අසන ලද ධර්මය බුදුන් වහන්සේගේ ම වූවක් බව ප්‍රකට කරති. එමගින් උන්වහන්සේ මෙම දේශනා තමන්ගේ ප්‍රබන්ධ විශේෂයක් නො වන බව ප්‍රකාශ කරති. ධර්මයේ කර්තෘභාවය හෙවත් ශාස්තෘත්වය බුදුන් වහන්සේට පවරා තමන්

ශ්‍රාවකයෙකු පමණක් බව ප්‍රතිඥා කෙරේ ( අංගුත්තර නිකායට්ඨකථා 1, 2003, පි7). එසේ ම "භාග්‍යවතුන් වහන්සේගේ මෙම වචන උන් වහන්සේ හමුවෙහි දී ම මා විසින් පිළිගන්නා ලද්දකි. ම විසින් මෙම ධර්මය ම පැහැදිලි සෝතද්වාරයෙන් යුතුව ද අමතක නො වීමෙන් හා නො මුලා වූ සිහියෙන් ද අසන ලද්දකි. මේ හැර අන් කිසිවක් මා විසින් නො කරන ලදී" යනාදී වූ අර්ථ ජනනය කිරීම සඳහා මෙම පාඨය සූත්‍රාන්ත ආරම්භයේ දී භාවිත කොට ඇති බව දැක්වේ. (දීඝනිකායට්ඨකතා1, 2008, පි.35). මේ යෙදුම මගින් ධර්මය කෙරෙහි ශ්‍රාවකයා තුළ ශ්‍රද්ධාව උපදවා විශ්වසනීය දේශනාවක් වශයෙන් බුද්ධ වචනය සුරක්ෂිත කරනු ලැබෙයි. වාචික දේශනා නිරන්තරව නිශ්චිත ශ්‍රාවකයන් පිරිසක් ඉදිරියේ ඉදිරිපත් කරනු ලබන දැනුමකි. ශ්‍රාවකයකු නොමැති තැන වාචික දැනුමකට ද පැවැත්මක් නැත. පොතක පාඨක පිරිස යනු කතුවරයාගේ කල්පිතයකි. එහෙත් වාචික දේශනාවක ශ්‍රාවකයන් අවිනිශ්චිත හෝ කල්පිත පිරිසක් නො වේ. ශ්‍රාවකයා යනු දේශනාවේ දෘෂ්ටාන්ත විපාක අත්විඳින සාක්ෂි කරුවායි. ඔහු දේශනා වේ ප්‍රතිඵලය දරන්නා යි. මේ නිසා සූත්‍රවල ශ්‍රාවක සම්පත්තිය ඉතා වැදගත් මාතෘකාවක් වේ.

### 9. කාල ප්‍රකාශක වචනය

කිසියම් දේශනාවක් ඉදිරිපත් කරනු ලබන කාලය පිළිබඳ විස්තරය මෙයින් පැවැසේ. නිදානයන්හි කාල ප්‍රකාශක වචනය සූත්‍ර, විනය, අභිධර්ම යන තුන් පිටකයන්හි යෙදී ඇත්තේ තුන් ආකාරය කිනි (විමලකීර්ති හිමි, 2498, පි.28). සූත්‍ර පිටකයේ ''එකං සමයං" කියා කම් විබතෙන් ද විනය පිටකයෙහි "තෙන බො පන සම යෙන" කියා කරණ විභක්තියෙන් ද අභිධර්ම පිටකයෙහි ''තස්මිං බො පන සමයෙ'' කියා සප්තමී විභක්තියෙන් ද කාල ප්‍රකාශක වචනය දක්වා තිබේ.

සංයුත්ත නිකාය අට්ඨකථාවේ මෙසේ තුන් ආකාරයකින් කාලය දැක්වීමට හේතුව පහදා ඇත. ඒ අනුව සූත්‍ර පිටකයේ "එකං සමයං" යනුවෙන් කම් විබත යොදන ලද්දේ බුදුන් වහන්සේගේ කරුණා සමාපත්ති විහාරයත් ධර්ම දේශනාවත් අතර පවත්නා අත්‍ය



න්ත සංයෝගය නිදර්ශනය කිරීම සඳහා ය. විනය පිටකයේ කරණ විබත යොදන ලද්දේ ශික්ෂා පද පැණවීමට හේතුව දක්වනු සඳහා ය. අභිධර්ම පිටකයේ සත්තමී විපත යොදන ලද්දේ භාව ලක්ෂණ දක්වනු සඳහා ය. ප්‍රස්තුත ධර්මයට අදාළ පරිදි කාල ප්‍රකාශන පදය භාවිත කොට ඇති ආකාරය මෙයින් පෙනේ.

එක් එක් සූත්‍රය වෙන් වෙන් වශයෙන් කිනම් සංවත්සරයක, ඍතුවක, මාසයක, පක්ෂයක, රාත්‍රී භාගයෙක, දිවා භාගයෙක කියන ලද්දේ ද යන්න ආනන්ද තෙරුන් විසින් මැනවින් දැන සිටි බව අටුවාවේ දැක්වේ. එහෙත් එක් එක් සූත්‍රයෙහි ඒ ඒ කාලය අසුවල් සංවත්සරය, අසුවල් ඍතුව, අසුවල් මාසය, අසුවල් පක්ෂය, අසුවල් රාත්‍රී-භාගය, අසුවල් දිවා භාගය යනුවෙන් වෙන් වෙන්ව දැක්වීමට යාමේ දී එම සූත්‍ර මතක තබා ගැනීමට හෝ උදෙසීමට හෝ උදෙස වීමට පහසු නො වේ. එවිට සූත්‍ර නැවත නැවත බොහෝ කොට කීමට ද සිදු වෙයි. එබැවින් එක් පදයකින් ම ඒ සියලු අර්ථ එක්තැන් කොට "එකං සමයං" යන යෙදුම සෑම සූත්‍රයකම දක්වා ඇත (දීඝ නිකායට්යකථා1, 2008, පි.36).

කිසියම් දේශනාවක් ඉදිරිපත් කළ කාලය පිළිබඳ සටහන් තැබී මේ වැදගත්කම හඳුනාගත් බවට මෙම යෙදුම සාක්ෂියකි. නූතන දැනුම ප්‍රකාශිත මාධ්‍යයන්හි ඒවා ප්‍රකාශයට පත් කරන ලද කාලය අවශ්‍ය යෙන් ම දක්වනු ලැබේ. පොතක් නම් එය ප්‍රකාශ කළ වර්ෂය දැක්වීම වැදගත් ග්‍රන්ථවිඥාපන විස්තරයකි. ප්‍රකාශනයේ හා තොර තුරුවල අදාළත්වය හා කාලීන බව පිළිබඳ වැටහීමක් එයින් උප යෝජකයාට ලබාගත හැකි ය.

### 10. දේස සම්පත්තිය

දේස සම්පත්තිය යනු බුදුන් වහන්සේ ධර්ම දේශනාව පවත් වන ලද ස්ථානය යි. කිසියම් සූත්‍ර දේශනාවක් පවත්වන ලද හෝ විනය ශික්ෂා පදයක් පණවන ලද ස්ථානය කොතැනද යන්න දැක්වීම මෙහි අරමුණ යි. සූත්‍ර පිටකය හා විනය පිටකය විමසා බැලීමේ දී බුදුන්වහන්සේ එක් එක් දේශනා ඉදිරිපත් කොට ඇති ස්ථානවල නම් පැහැදිලිව හඳුනා ගතහැකි ය. උන්වහන්සේ වැඩසිටි විහාර, ආරාම,

වන උයන් ආදිය ද ඒවා පිහිටි නගර හා ගම්වල නම් ද නිදානයෙහි ඇතුළත් වේ. බුදුන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව බරණැස ඉසිපතනේ මිගදාය නම් ස්ථානයේ සිදු කළ බව ධම්මචක්කප්පවත්තන සූත්‍රයේ සඳහන් වේ. බ්‍රහ්මජාල සූත්‍රය රජගහ නුවර අම්බලට්ඨිකා උයනේ රාජ ගෘහයේ දී ද සාමඤ්ඤඵල සූත්‍රය රජගහනුවර කෝමාරභච්ච ජීවකයාගේ අඹ වනයේ දී ද අම්බට්ඨ සූත්‍රය ඉච්ඡානංගල නම් ග්‍රාමයේ වන ලැහැබේ දී ද සෝනදණ්ඩ සූත්‍රය චම්පා නුවර ගර්ගරා පොකුණු තෙර දී ද කූටදන්ත සූත්‍රය මගධ රට ඛාණුමත නම් බමුණු ගම අඹ උයනක දී ද වදාළ බව එම සූත්‍රවල නිදානයෙහි දක්වා ඇත.

බොහෝ සූත්‍ර බුදුන් වහන්සේ සැවැත් නුවර අනේපිඩුසිටුතුමා විසින් කළ ජේතවනාරාමයේ දී ප්‍රකාශිත ඒවා බව සූත්‍ර පිටකය විමසීමෙන් පැහැදිලි වේ. බුදුන් වහන්සේ චාරිකාවේ වඩිනා අතර මඟ විවිධ ස්ථානවල දී මෙම දේශනාවන් ඉදිරිපත් කළ බව වැඩිදුරටත් සඳහන් ය. එක් එක් බුද්ධ දේශනාවන් ප්‍රකාශිත ස්ථාන නාම සූත්‍රාන්තයන්හි පැහැදිලිව වෙන් වෙන් වශයෙන් දක්වා තිබීම ග්‍රන්ථවිඥාපනයේ වැදගත් ලක්ෂණයකි. යම් දූනුමක් නිවැරදිව හඳුනා ගැනීමට, සොයා ගැනීමට හා එය තිබෙන ස්ථානය කරා ළඟා වීමට පුද්ගලයාට මඟ පෙන්වන්නේ දූනුම ප්‍රකාශිත ස්ථානය යි. එසේ ම සූත්‍රයේ අනන්‍යතාවට හා දේශනාවේ අන්තර්ගතයට නිශ්චිත අදාළත්වයක් ද මෙහි පැවැතිය හැකි වේ. පොත් පත් ප්‍රකාශනයේ දී ඒවා ප්‍රකාශයට පත්කරන ලද රට හෝ නගරය ඉදිරිපත් කිරීමත් ග්‍රන්ථවිඥාපන විස්තරාංගයක් වශයෙන් භාවිතයට ගැනීමත් වර්තමානයේ සිදුවන දෙයකි.

**11. දේසක සම්පත්තිය**

දේසක සම්පත්තිය යනු ධර්ම දේශනා කළ තැනැත්තා කවරෙක් ද යන්න දැක්වීම යි. ග්‍රන්ථවිඥාපන විස්තරයක් වශයෙන් ගතහොත් එය කතුවරයා පිළිබඳ අදහසට සමාන වේ. කතුවරයා යනු කිසියම් කෘතියක බුද්ධිමය හෝ කලාත්මක අන්තර්ගතය කෙරෙහි වගකියන තැනැත්තා ය (රණසිංහ, 1998, පි.154). සූත්‍රාන්තයන්හි මේ වගකීම පිළිබඳ දක්වනු ලබන්නේ "භගවා" යන පදයෙනි. බුදුන් වහන්සේ සඳහා භගවා යන නාමය පොදුවේ සෑම සූත්‍රයක ම භාවිත කොට



ඇත. භගවා යනු ගුරුවරයා යන අර්ථයෙන් ද සියලු ගුණවලින් විශිෂ්ටත්වයට පත් තැනැත්තා යන අර්ථයෙන් ද බුදුන් වහන්සේට පමණක් ව්‍යවහාර කෙරෙන නාමයකි. ත්‍රිපිටකයේ සෑම දේශනාවක් ම බුදුන් වහන්සේගේ යැයි පිළිගැනීමට මෙම දේශක සම්පත්තිය හේතු වී ඇත. ඒ අනුව උන්වහන්සේ ත්‍රිපිටකයේ ඇතුළත් සියලු දේශනාවන්හි කර්තෘවරයා ද නිර්මාපකයා ද වේ.

සූත්‍ර පිටකය ගත් කල්හි එහි බුදුන් වහන්සේගේ ශ්‍රාවකයින් විසින් සිදු කොට ඇති දේශනා ද ඇතුළත් වේ. නිදසුනක් ලෙස අනුමාන සූත්‍රය මහා මොග්ගල්ලාන තෙරුන් විසින් භග්ග රට සුංසුමාරගිර නුවර මිගදාය නම් උයනක දී භික්ෂූන්ට දේශනා කරන ලද්දකි (මජ්ඣිමනිකාය1, 2005, පි. 228). සම්මාදිට්ඨි සූත්‍රය බුදුන් වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ සිටිය දී ම ශාරිපුත්ත තෙරුන් විසින් භික්ෂූන්ට දේශනා කරන ලද්දකි (එම, පි.110). අනංගන සූත්‍රය සැරියුත් හා මුගලන් යන දෙනම වහන්සේ විසින් කළ සාකච්ඡාවකි (එම, පි.74) රථවිනීත සූත්‍රය සැරියුත් තෙරුන් හා පුණ්ණ මන්තානිපුත්ත තෙරුන් අතර අන්ධවනයේ දී ඇති වූ සාකච්ඡාවකි. බුදුන් වහන්සේ මෙන් ම ශාරිපුත්ත මහා මොග්ගල්ලායන, මහාකාශ්‍යප, අනුරුද්ධ, රේවත හා ආනන්ද යන තෙරුන් වහන්සේලා අතර සිදුවූ සාකච්ඡා හා සංවාද ඇසුරින් මහාගෝසිඞග වැනි සූත්‍ර නිර්මාණය වී තිබේ. ගෝසිඞග නම් වූ සල් වනය අනුරුද්ධ, නන්දිය, කිම්බිල ආදී නම් ඇති වෙනත් බොහෝ තෙරුන් ධර්ම සාකච්ඡා සඳහා රැස්වූ ස්ථානයකි. මෙයින් පැහැදිලි වන්නේ සූත්‍ර දේශනාවන් පැවැත්වූ දේශකයන් අතර බුදුන් වහන්සේගේ ශ්‍රාවක පිරිස ද වූ බව යි. චූල්ල හත්ථිපදොපම සූත්‍රය බුදුන් වහන්සේ විසින් සිදු කළ දේශනාවක් වන අතර මහා හත්ථිපදොපම සූත්‍රය ශාරිපුත්ත තෙරුන් වහන්සේගේ දේශනාවකි.

සංයුත්ත නිකායේ භික්ෂුණී සංයුත්තයේ සූත්‍ර අනුව තෙරණියන් විසින් ද දේශනා ඉදිරිපත් කොට ඇත. ඒ අනුව ත්‍රිපිටක යෙහි දේශනා බුද්ධ භාෂිතය පමණක් නො වේ. එහි බුද්ධ දේශනාවට අමතරව ශ්‍රාවක භාෂිත, දේවභාෂිත හා ඍෂි භාෂිත ද වශයෙන් චතුර්භාෂිතය ම අන්තර්ගත වේ (සංයුත්ත නිකාය1, 2005, පි.v). එසේ

වුවත් ත්‍රිපිටකයේ සඳහන් වෙනත් තැනැත්තන් විසින් සඳහන් කරන ලද දේශනා හා ප්‍රකාශන බුදුන් වහන්සේ විසින් අනුමත කිරීම නිසා හෝ බුද්ධ වචනයට අනුලෝම නිසා හෝ බුද්ධ දේශනා වශයෙන්ම සලකා ත්‍රිපිටකයට ඇතුළත් කොට ඇත.

සූත්‍රයක් තවත් සූත්‍රයකින් වෙන් කර හඳුනා ගැනීමට ද එහි දේශකයා පිළිබඳ විස්තරය වැදගත් වේ. යම්කිසි ගාථාවක්, සූත්‍රයක් හෝ වෙනත් ප්‍රකාශයක් සිදු කරනු ලැබ ඇත්තේ කවරෙකු විසින් ද යන්න හඳුනා ගැනීමේ හැකියාව මේ නිසා ලැබේ. දේශකයා බුදුන් වහන්සේ ද භික්ෂුවක් ද භික්ෂුණියක ද නැතිනම් වෙනත් තැනැත්තෙක් ද යන්න මෙහි දී පැහැදිලි කර ගත හැකි ය. දේශනාවල කර්තෘත්වය පිළිබඳව සූත්‍රාන්තයන්හි සඳහන් කොට තැබීමට සූත්‍ර සම්පාදකයන් විසින් ගෙන ඇති ප්‍රයත්නය උන්වහන්සේලා තුළ පැවති ග්‍රන්ථ විඥාපන දැනුමට තවත් නිදසුනකි.

## 12. පිරිස් සම්පත්තිය

බුදුන් වහන්සේගේ දේශනා ශ්‍රවණය කොට ධර්මාවබෝධය ලැබූ පිරිසක් උන්වහන්සේ සමඟ වාසය කළහ. ඒ පිරිස හඳුන්වා ඇත්තේ පිරිස් සම්පත්තිය යනුවෙනි. බුදුන් වහන්සේ විසින් සෑම දේශනාවක් ම කිසියම් පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් සඳහා ඉදිරිපත් කරන ලදහ. එම පිරිස පිළිබඳව විස්තරයක් සෑම සූත්‍රාන්තය කම සඳහන් වේ. එම ශ්‍රාවක පිරිසට පෙදුවේ භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිව්වනක් පිරිස ඇතුළත් වූහ. නිදසුනක් ලෙස බුදුන් වහන්සේගේ පළමු දේශනාවේ ශ්‍රාවක පිරිස වශයෙන් පංචවග්ගිය භික්ෂූන් වූ බව සූත්‍රයේ සඳහන් කරනු ලැබේ. බුදුන් වහන්සේ මහා පදාන සූත්‍රය දේශනා කරන ලද්දේ දානයෙන් පසු කරෙරි මණ්ඩල නම් විවේකාගාරයට රැස් වූ භික්ෂු පිරිසක් සඳහා ය. (දීඝනිකාය2, 2005, පි.2). බ්‍රහ්මජාල සූත්‍රය දේශනා කරන ලද්දේ අම්බලට්ඨිකා උයනේ නිසීදන ශාලාවේ තමන් වහන්සේ සමඟ රාත්‍රී පහන් කළ භික්ෂූන් පිරිසක් සඳහා අලුයම් කාලයේ දී ය (දීඝනිකාය1, 2005, පි.4). සාකච්ඡාවක් නම් සාකච්ඡාවට සහභාගී වූ අනෙක් පිරිස පිරිස් සම්පත්තිය ලෙස සැළකේ. සාමඤ්ඤඵල සූත්‍රය බුදුන් වහන්සේ හා



මගධාධිපති අජාසත්ත රජතුමා අතර සිදු වූ දීර්ඝ සාකච්ඡාවක ස්වරූපයෙන් ඉදිරිපත් කොට ඇත. අම්බට්ඨ සූත්‍රය ද අම්බට්ඨ හා පොක්කරසාදී යන නම් ඇති බ්‍රාහ්මණයන් දෙදෙනෙකු සමඟ බුදුරදුන් විසින් කළ සාකච්ඡාවකි.

බොහෝ විට බුදුන් වහන්සේගේ දේශනාවන්ට ඉලක්ක වී ඇත්තේ භික්ෂූන් ය. සැවැත්නුවර ජේතවනාරාමය බුදුන් වහන්සේ බොහෝ භික්ෂූන් සමඟ වාසය කළ ස්ථානයකි. එහි විසූ භික්ෂූන්ට බුදුන් වහන්සේ නිරන්තරව දේශනා ඉදිරිපත් කළහ. විටින් විට භික්ෂූන් ඉදිරියට වැඩම කරන බුදුන් වහන්සේ "මහණෙනි" යැයි උන්වහන් සේලා අමතති. එවිට භික්ෂූහු "භාග්‍යවතුන් වහන්ස" යැයි පිළිතුරු දෙති (මජ්ඣිමනිකාය1, 2005, පි.154). එම ඇමතීම බුදුන් වහන්සේගේ දේශනාවකට ප්‍රාරම්භය වේ. සබ්බාසව, මූලපරියාය, ආකඞ්ඛෙය්‍ය, සම්මාදිට්ඨි, නිවාප, අරියපරියෙසන ආදී සූත්‍ර එසේ එක් තැනක රැස්ව සිටි බොහෝ භික්ෂූන්ට දේශනා කළ සූත්‍ර වශයෙන් නිදසුන් කළ හැකි ය. සල්ලේඛ සූත්‍රය මහා චුන්ද තෙරුන්ට ද මහා සීහනාද සූත්‍රය සාරිපුත්ත තෙරුන්ට ද වත්ථූපම සූත්‍රය සුන්දරික භාරද්වාජට ද 'වම්මික' සූත්‍රය කුමාර කාශ්‍යප තෙරුන්ට ද වශයෙන් තනි පුද්ගලය න්ට දේශනා කළ ඒවා වේ.

පසේනදී කොසොල් රජු ද බුදුරදුන්ගේ බොහෝ සූත්‍ර දේශනා ශ්‍රවණය කළ ශ්‍රාවකයෙකි. එම රජු තමාට ඇතිවූ සැක හා ගැටලුවලට පිළිතුරු ලබා ගැනීම සඳහා නොයෙක් විට බුදුන් වහන්සේ හමුවට ගොස් ඒවාට විසඳුම් ලබාගෙන පිටව ගිය ආකාරය කෝසල සංයුත් තයෙන් හෙළි වේ. සැවැත්නුවර ජේතවනාරාමයේ දී කොසොල් රජුට මෙම දේශනාවන් සියල්ල බුදුන් වහන්සේ විසින් ම පවත්වා ඇති බව පෙනේ. මීට අමතරව මාරයා, මාරදූවරුන්, බ්‍රහ්මයන්, යක්ෂයන්, සක්‍රයා, බ්‍රාහ්මණයන් වැනි පුද්ගලයන් ද බුදුන් වහන්සේගේ දහම ඇසූ ශ්‍රාවක පිරිසට අයත් වේ.

බුදුන් වහන්සේගේ ධර්මය ශ්‍රවණය කළ පිරිස අතර දෙවියන් ද සිටි බව දේවතා සංයුත්තයේ හා දේවපුත්ත සංයුත්තයේ සූත්‍රවලින් පැහැදිලි වේ. මේ සූත්‍ර දේශනා ඇසූ දෙවියන් අතර නිර්නාමික දෙවියන් මෙන් ම සටීකාර, කස්සප, අනාථපිණ්ඩික, සතුල්ලපකායික

දේවතා ආදි නම් ලද දෙවියෝ ද වෙති. සැවැත් නුවර දෙව්රම, රජගහනුවර තපෝදාරාමය හා වේළුවනාරාමය යන ස්ථානවල දී දෙව් වරුන් පෙරයම ඉක්ම ගිය කල්හි මුළු වෙහෙර බබුළුවා භාග්‍යව තුන් වහන්සේ වෙත එළැඹ වැඳ එකත් පසෙක සිට ධර්මශ්‍රවණය කළ බව සූත්‍රවල දැක්වේ.

නූතන දැනුම් ප්‍රකාශන බොහෝවිට කල්පිත පාඨක පිරිසක් හෝ ශ්‍රාවක පිරිසක් සඳහා ඉදිරිපත් කරනු ලැබේ. එහි දී කතුවරයා තමන් සිතින් මවාගත් පිරිසක් වෙත දැනුම රැගෙන යයි. එහෙත් දේශනාවක් නිශ්චිත වැදගත්කමක් දරන්නේ එය යථාර්ථවත් ශ්‍රාවක පිරිසක් අමතන බැවිනි. මේ යථාර්ථවත් ශ්‍රාවක පිරිස පිළිබඳ විස්තර කිරීම සූත්‍ර නිදානයේ ඇති සුවිශේෂ ග්‍රන්ථවිඥාපන ලක්‍ෂණයක් බව පෙනේ.

### 13. සූත්‍ර සමෝධානය

බුදුන් වහන්සේගේ දේශනාව ශ්‍රවණය කළ ශ්‍රාවකයා ලබන ලද අධිගමය හෝ අද්දැකීම පිළිබඳ ප්‍රකාශයෙන් සූත්‍ර සමාප්තිය ඇතුළත් වේ. බුදුන් වහන්සේගේ පළමු දේශනාව වන ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙහි එම දේශනාව ඇසූ කොණ්ඩඤ්ඤ තෙරුන් කෙලෙස් මල දුරු කොට දහම් ඇස පහළ කර ගත් බවත් උන්වහන්සේ බුදුරදුන්ගෙන් දහම් අසා පළමුව චතුස්සත්‍ය අවබෝධ කළේය යන අර්ථයෙන් අඤ්ඤා කොණ්ඩඤ්ඤ නම් වූ බවත් සූත්‍රා වසානයේ දක්වනු ලැබේ.

බුදුන් වහන්සේගේ දේශනා නිෂ්ඵල නොවූ බව පැහැදිලි වන්නේ මෙම සූත්‍ර සමෝධානය කියැවීමෙනි. දේශනා අසූ ශ්‍රාවක යන්ගේ ප්‍රතික්‍රියාව කුමක් වී ද යන්න මෙහි දක්වනු ලැබේ. බුදුරදුන් විසින් යම් දේශනාවක් සාමූහිකව භික්ෂූන්ට දේශනා කළ විට එය එම භික්ෂූන් විසින් සතුටින් පිළිගන්නා ලද බව දැක්වීම සාමාන්‍ය ක්‍රමය යි. එසේ වුවත් මූලපරියාය සූත්‍රය වැනි දේශනාවක් ගත් කල්හි එහි සඳහන් වන්නේ එම දේශනාව පිළිබඳ භික්ෂූන් නොසතුටු වූ බව යි (මජ්ඣිමනිකාය1, 2005, පි.18). මෙසේ භික්ෂූන් සතුටු නො වීමට හේතුව එම දේශනාවේ අර්ථය උන්වන්සේලාට තේරුම් ගැනීමට



අපහසු වීම යි. එම දේශනාව බුදුන් වහන්සේ පවත්වා ඇත්තේ දැනුමෙන් තමන් උසස්යැයි මානය උපදවා සිටි බ්‍රාහ්මණ වංශයෙන් පැවිදිවූ භික්ෂු පිරිසගේ මානය බිඳ හෙළීම පිණිස ආත්මවාදය පිළිබඳ ගැඹුරු දේශනාවක් ඉදිරිපත් කිරීම බව අටුවාවේ සඳහන් වේ. මෙයින් පැහැදිලි වන්නේ බුදුන් වහන්සේගේ සෑම දේශනාවක් ම ප්‍රතිඵල දායක වී ඇති බව යි.

රහතන් වහන්සේලා අතර සිදු වූ ධර්ම සාකච්ඡා වැනි සූත්‍රා න්තවල දී උන්වහන්සේලා එම සුභාෂිතයන් අන්‍යෝන්‍ය වශයෙන් සතුටින් අනුමෝදන් වූ බව දක්වා ඇත (එම, පි.74). බුද්ධ දේශනාවන් ඇසූ සමහර ගිහි බ්‍රාහ්මණයෝ ඉතා ඉහළින් බුදුන් වහන්සේගේ ගුණ වර්ණනා කරමින් බුදු සසුනේ පැවිද්ද ඉල්ලා සිටියහ. දේශනාවන් ඇසීමෙන් ඔවුන් ලැබූ අවබෝධය පිළිබඳ උපමා වශයෙන් මෙසේ කියා ඇත. "භාග්‍යවතුන් වහන්ස, ඉතා මැනවි. යටිකුරු කරන ලද්දක් උඩුකුරු කරන ලද්දේ යම් සේ ද, වැසුණු දෙයක වැසුම් හරින්නේ යම් සේ ද, මංමුළා වූවකුට මඟ කියන්නේ යම් සේ ද, ඇස් ඇත්තා රූප දකින්නා සේ ද, අන්ධකාරයෙහි තෙල් පහනක් දල්වන්නේ යම් සේ ද එපරිද්දෙන් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් අයුරින් ධර්මය දේශනා කරන ලදී. ඒ මම ගෞතමන් වහන්සේත් ධර්මයත් සංඝයාත් සරණ යමි, මා පැවිදි උපසම්පදා කරන සේක්වා" (එම, පි. 92). බුදුරදුන්ගෙන් පැවිද්ද ද උපසම්පදාවද ලබූ උන්වහන්සේලා මහත් වීර්ය කොට බ්‍රහ්මචර්යාවේ අවසානය වූ අර්හත් ඵලයට පැමිණ රහතුන් අතර එක්තරා කෙනෙක් බවට පත් වූ බව ද සූත්‍රාන්තයන්හි සඳහන් කොට ඇත. තවත් ශ්‍රාවකයෙක් සෝවාන් ආදී වූ මාර්ග ඵල වලින් සසුනේ නිෂ්ටාවට පත් වූ බව පවසනු ලැබේ.

සමහර තැනැත්තෙක් බණ අසා දිවි හිමි කොට භවත් ගෞතමයන් වහන්සේගේ සරණ ගිය උපාසයකයෙක් වන බවට ප්‍රතිඥා දී පිටව ගිය බව සඳහන් කොට ඇත (එම, පි.446). පැවිදි වීමට තරම් භාග්‍ය නො ලද පුද්ගලයන් තමන්ගේ මිථ්‍යා දෘෂ්ටික ආගම් අතහැර බෞද්ධ උපාසකයන් බවට පත්වීමට ද මේ දේශනා හේතු වූ බව පෙනේ. සච්චක වැනි නිගන්ඨනාථ පුත්ත ලබ්ධිකයන් බුදුන්වහන්සේගේ දේශනාවන් අසා සිට අවසානයේ තමන්ට බොහෝ

කටයුතු ඇති යැයි පවසා සිතින් නොව වචනයෙන් සතුට ප්‍රකාශ කොට හුනස්නෙන් නැගී නික්ම ගිය බව ද සඳහන් වේ (එම, පි.592).

බුද්ධ දේශනාවන් ශ්‍රවණය කිරීමට පැමිණි දෙවියන්, බ්‍රහ්ම යන්, ගාන්ධර්වයන් හා යක්‍ෂයන් වැනි පිරිස් එම දේශනා අවසානයේ දී සතුටු සිත් ඇතිව බුදුන් වහන්සේට වැඳ පැදකුණු කොට එහි ම අතුරුදහන් වූ බව සූත්‍රාන්තයන්හි සඳහන් කොට ඇත. එසේ වුවත් මාර දිව්‍ය පුත්‍රයා එම දේශනා අසා සතුටින් නොව නො සතුටු සිත් ඇති ව අතුරුදහන් වූ බව නිරතුරු දක්වේ.

මෙලෙස බුදුන් වහන්සේගේ ධර්ම දේශනා අවසානයේ දී ඇති වූ තත්වය කවරේද යන්න සාකච්ඡා කොට එයින් සූත්‍ර සමෝධානය සිදු කිරීමට හේතු කිහිපයක් බලපා තිබේ. එයින් වැදගත් එකක් වන්නේ බුදුන් වහන්සේගේ දේශනාවන් නිරතුරුව ම ශ්‍රාවක යාට ප්‍රතිඵලදායක වූ බව යි. ශ්‍රාවකයාට නිවන් දොරටු විවර කිරීමෙන් දේශනාවේ අරමුණ ඉටු විය. එසේ ම විටෙක එය බුද්ධ දේශනාවේ ප්‍රචාරය පිළිබඳ සටහනකි. මෙම සටහන සූත්‍ර දේශනාව ලොවට පිළිගැන්වීමට වැදගත් ප්‍රචාරක උපක්‍රමයක් වැනි ය. සූත්‍රය පිළිබඳ පසු සටනක් හෝ විචාරයක් වශයෙන් ද එම සටහන සැලකිය හැකි ය. භික්ෂූන්ගේ ධර්ම දේශනා අවසානයේ දී එම දේශනා සමෝධානයට පත්වන්නේ ශ්‍රාවකයන් විසින් සාධු නාදයක් පැවැත් වීමෙනි. සූත්‍ර දේශනාව නිවැරදි, පැහැදිලි හා පිළිගත් එකක් බව දක් වීමට මෙවැනි පාඨ සූත්‍රාන්තයන්හි භාවිතයට ගෙන ඇත. සූත්‍ර දේශනා පිළිබඳ මෙසේ තබන ලද පසු සටහන් කෘතියක් අතිරේක වශයෙන් විස්තර කිරීම හා හඳුනාගැනීම සඳහා සුචි පත්‍රයක ලියා තබන ලද ග්‍රන්ථ විඥාපන සටහනක් වැනි ය.

### 14. ඉතිවුත්තක

තරමක් වෙනස්ව ගිය නිදාන දක්වීමේ ක්‍රමයක් ඉතිවුත්තක පාළියේ දක්නට ලැබේ. එහි සූත්‍ර ආරම්භ වන්නේ "වුත්තං හෙතං භගවා වුත්තමරහතා" යනාදී වශයෙනි. යම්කිසි වැරදි මතයක එල්බ ගත් භික්ෂුවකට එම මතය දුරු කිරීමට ඒ ගැන දක්විය හැකි බුද්ධ මතය මෙය යැයි දක්වනු සඳහා කරුණු හරිහැටි වටහා ගත්තවුන්



විසින් බුදුන් වහන්සේගේ ම දේශනා පාඨයක් ගෙන හැර පෑමේ ක්‍රමය ඉතිවුත්තක නම් ශාසනිකාංගය ඇති වීමට හේතු විය. "මෙසේ කියන ලද්ද" යනු ඉතිවුත්තක යන්නෙහි වචනාර්ථය යි. බුදුන් වදාළ ධර්මය පිළිබඳ යම් කරුණක් තව කෙනෙකුට පැහැදිලි කිරීමේ දී හෝ විස්තර වශයෙන් කෙනෙකුගෙන් අසා දැන ගැනීමේ දී හෝ තමන් බුද්ධ වචනය වශයෙන් නිවැරදිව සලකා ගත් යමක් උද්ධෘත පාඨයක් වශයෙන් ප්‍රකාශ කිරීමේදී හෝ එම පාඨය ඉතිවුත්තකයක් වන්නේ යැයි සඳහන් වේ (ප්‍රඥාසාර හිමි, 1961, පි.7).

ආනන්ද තෙරුන් විසින් ඉතිවුත්තක පාළියේ එන සූත්‍රවල මුලට යොදන ලද "වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මේ සුතං" යන පාඨයට අටුවාවේ අරුත් තෝරා ඇත්තේ, "භාග්‍යවතුන් වහන්සේ විසින්, අර්හතුන් වහන්සේ විසින් මෙය වදාළ බව මවිසින් අසන ලදී" යනුවෙනි (ප්‍රඥාසාර හිමි, 1961, පි.16). කුමක් නිසා අනෙක් සූත්‍රා න්තයන්හි මෙන් "එවං මේ සුතං" ආදී නයින් කාල දේශාදීන් නො දක්වා අමුතු නිදානයකින් කියන ලද්දේ ද යන්න පැහැදිලි කොට ඇත. ඒ සඳහා යොදා ගෙන ඇත්තේ තථාගතයන් වහන්සේ විසින් බහුශ්‍රැත භාවයෙන් අගතැන්හි තබන ලද ඛුජ්ජුත්තරා තෙරණියගේ කතා පුවතකි. ඇය බුදුන් වහන්සේ කොසඹෑ නුවර වැඩ වසන කල්හි කලින් කල උන්වහන්සේ ළඟට ගොස් බණ අසා ඇසූ බණ ඇතුළු නුවර ගොස් සාමාවතී ප්‍රමුඛ ආර්ය ශ්‍රාවිකාවන් පන්සියයකට උන්වහ න්සේ විසින් දේශනා කරන ලද නියායෙන් සඳහන් කළා ය. එසේ ප්‍රකාශ කරද්දී ඈ "වුත්තං හෙතං භගවතා වුත්තමරහතාති මේ සුතං" යනාදියෙන් නිදානය තැබුවා ය. යම් හෙයකින් ඒ නගරයෙහි දීම භාග්‍යවතුන් වහන්සේ හමුවෙහි දී අසා එදිනෙදා ම ඈ විසින් ඒ ස්ත්‍රීන්ට නැවත කියන ලද ද එබැවින් "එකං සමයං භගවා කොසම්බියං විහරති" (එක් සමයෙක්හි භාග්‍යවතුන් වහන්සේ කොසඹෑ නුවර වැඩවාසය කරන සේක) යනුවෙන් කාල-දේශ දක්වා නිදානය තැබීමක් අවශ්‍ය නොවේ. මක්නිසාද එහි දී සූත්‍රයේ කාල-දේශය ලක්ෂණ ප්‍රසිද්ධ බැවිනි. මෙසේ පරම්පරාවෙන් භික්ෂූන් අතරෙහි ද ඇය විසින් තබන ලද නිදානය ම ප්‍රකට විය (ඉතිවුත්තකට්ඨකථා, 2008, පි.44). ඒ ආකාරයෙන් ආනන්ද තෙරුන් විසින් ද භාග්‍යවතුන්

වන්සේ විසින් වදාරන ලදැයි අසන ලද එම සූත්‍ර මේ ආකාරයෙන් ඉතිවුත්තක පාළියේ තබන ලදී.

## 15. නිදානය දැක්වීමේ ප්‍රයෝජන

ධර්මය සංගායනා කරන කල්හි සූත්‍රාන්තයන්හි නිදාන පාඨය දක්වන ලද්දේ කුමක් පිණිස ද? උන්වහන්සේලාට බුදුන්වහන්සේගේ වචනය පමණක් ගෙන සංග්‍රහ කළ යුතුව තිබුණා නො වේ ද? එසේ කළා නම් ත්‍රිපිටකයේ පැවැත්මට හා ස්වරූපයට කෙබඳු වෙනස් කම් ඇති විය හැකිව තිබුණේ ද? මේ ප්‍රශ්න පිළිබඳ සංගීති කාරකයන් වහන්සේලා අවධානය යොමු කළහ. නිදානය තැබීමට හේතුව ලෙස දේශනාවේ පැවැත්ම, දේශනාව ගැන මුළා නො වීම, දේශනාව ඇදහිය යුත්තක් බවට පත් කිරීම යන කරුණු ඉදිරිපත් කොට ඇත. (මහා නිද්දෙසට්ඨකථා, 2008, පි.45). කාල, දේශ, දේශක, පිරිස, අපදේශ ආදියෙන් සංග්‍රහ කොට තබන ලද දේශනාව බොහෝ කල් පැවැතීමට හේතු වේ. එයින් ශ්‍රාවකයාට සූත්‍රය පිළිබඳ මුළා නො වී ඇදහිය යුත්තක් බවට පත් වන්නේ ය. එබැවින් මහා කාශ්‍යප තෙරුන් පළමු සංගායනාවේ දී බ්‍රහ්මජාලාදී සූත්‍රවල නිදානය විමසන ලදී. ඒවා විසඳමින් ධර්ම භාණ්ඩාගාරික ආනන්ද තෙරුන් "එවං මේ සුතං" ආදී වශයෙන් නිදානය පවසන ලදී.

නිදානය පාඨය යොදනු ලබන්නේ ශාස්තෘ සම්පත්තිය ප්‍රකාශ කිරීම සඳහා ය යනුවෙන් තවදුරටත් දක්වා තිබේ. බුදුන් වහන්සේගේ ධර්ම දේශනාවේ පෙර සූදානමක් කියා දෙයක් නැති බව අටුවාවේ සඳහන් වේ. ඒ උන්වහන්සේ අනුමානයක්, අනුගමන යක් හෝ තර්කයක් නොමැතිව සම්මා සම්බුද්ධ වන බැවිනි. මෙසේ බුදුන් වහන්සේ සිව්විසාරද භාවයෙන් යුත්ත බව ද ආත්මාර්ථ හා පරාර්ථ යහපත පිණිස පවතින ප්‍රතිපත්ති ඇති බව ද ඒ ඒ තැනට පැමිණි පිරිසේ අදහස්වලට අනුරූප වූ තැනට සුදුසු වැටහීමෙන් ධර්ම දේශනා කළ බව ද දැක්වීම සඳහා නිදානය තබන ලදී. එබැවින් "සත්ථු සම්පත්තිං පකාසනත්ථං නිදාන වචනං" (නිදාන වචනය ශාස්තෘ සම්පත්තිය ප්‍රකාශ කිරීම සඳහා) යැයි කියන ලදී. එසේ ම නිදාන පාඨයෙන් ශාස්තෘන් වහන්සේගේ ප්‍රමාණ භාවය ප්‍රකාශ වීමෙන්



ශාසනයේ (දේශනාවේ) ප්‍රමාණ භාවය දැක්වේ. මෙලෙස නිදානය තැබීමේ ප්‍රයෝජන දත් තෙරුන් වහන්සේලා ධර්ම විනය සංගායනා කරන ආකාරය මැනවින් දනිමින් විවිධ නයින් නිදාන තැබූ හ. තැනක ගාථාවලින් නිදානය තබමින් ද තැනක කිසි අයුරකින් නිදානය නො තබමින් ද ධර්මය සංගායනා කළහ.

## 16. සමාලෝචනය

බුද්ධ දේශනාව සූත්‍රාකාරයෙන් සංග්‍රහ කරන ලද්දේ සංගීති කාරක තෙරුන් විසිනි. එහි පරමාර්ථය වූයේ ධර්මය සදොස් ලෙස අර්ථ කථනය කිරීමට තිබෙන ඉඩ වළකාලීම යි. බුදුන් වහන්සේ වැඩ සිටින කාලයේ පවා ධර්මය පිළිබඳ සදොස් අර්ථකථන ඉදිරිපත් කළ ශ්‍රාවකයෝ සිටියහ. එවිට බුදුන් වහන්සේ අභිමුඛයේ දී ඒවා පිළිබඳ තීරණයක් ගැනීමට ශ්‍රාවකයන්ට හැකි විය. එහෙත් බුදුන් වහන්සේ ගෙන් පසුව නොයෙක් පුද්ගලයන් විසින් ඉදිරිපත් කිරීමට ඉඩ ඇති අර්ථකථනවලින් ධර්මය ආරක්‍ෂා කරගැනීම ඉතා වැදගත් විය. කට පාඩමේ දී පහසුවක් ඇති කිරීම හා ධර්ම කරුණු ගිලිහී යාමට ඇති ඉඩකඩ වැළකීම ද මෙයින් අපේක්‍ෂා කරන ලදී. දේශනාවේ නිදානය පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීමෙන් ධර්මයට අතිරේක වශයෙන් ඇතු ළත් විය හැකිව තිබූ විවිධ අර්ථකථන වළක්වාලන ලදී. ධර්ම කරුණු ස්ථිර පදනමක් මත සංග්‍රහ කිරීමට මෙම සූත්‍රාන්ත ක්‍රමය උපකාර වීය.

ලොව විවිධ මාධ්‍යයෙන් බිහිවන දැනුම හා තොරතුරු පිළිබඳ අවබෝධය කාල අවකාශීය වශයෙන් මිනිසා වෙත රැගෙන යා යුතු වේ. ඒ සඳහා උපකාර වන්නේ එම දැනුම හා තොරතුරු මූලාශ්‍රය පිළිබඳ ග්‍රන්ථවිඥාපනය යි. තොරතුරක් පිළිබඳ මෙන්ම තොරතුරු ඇත්තේ කොහේ ද, එය ලබා ගන්නේ කෙසේ ද යන්න පිළිබඳ දැනුම ඉතා වැදගත් වේ. යම් තොරතුරක නිර්මාපකයා කවුරු ද එම තොර තුර කවදා, කොතැනක, කෙලෙස, කවරෙකු සඳහා බිහිවී තිබේ ද යනාදී වශයෙන් තොරතුරු පිළිබඳ මූලාශ්‍රය ගැන අසනු ලබන ප්‍රශ්න තොරතුරු හඳුනා ගැනීමේ දී, ප්‍රචාරණයේ දී හා සමුද්ධරණය කිරීමේ දී වැදගත් වේ. පුස්තකාලවල ඇති පොත් පත් පිළිබඳ තොරතුරු

වාර්තාවක් වන සූචිසංලේඛ ගොනුවකින් බලාපොරොත්තු වන්නේ ඉහත කී අවශ්‍යතා ඉටු කරගැනීම යි.

තොරතුරු වාර්තාකරණයේ දී සම්මුති ඇති කර ගැනීමේ වැදගත්කම බෞද්ධ ඉතිහාසය තුළ මැනවින් පෙන්වා දී ඇත. තොර තුරු ඒකීය ස්වරූපයෙන් ඉදිරිපත් කිරීම හා සංවිධානය කිරීම තොර තුරු ආරක්ෂා කිරීමේ දී හා බෙදා හැරීමේ දී උපකාරී වේ. මේ නිසා ග්‍රන්ථවිඥාපන සේවාවල ප්‍රමිතිගතභාවය වැදගත් සේ සැළකේ. මේ තත්ත්වය තුළ තොරතුරු ප්‍රචාරණයේ දී ග්‍රන්ථවිඥාපන ප්‍රමිති හා ක්‍රම ලොවට හඳුන්වා දී ඇත. තොරතුරු හා ප්‍රකාශන ලෝකයේ දැවැන්ත ව්‍යාප්තිය සමග මෙවැනි ග්‍රන්ථවිඥාපන සේවාවල අවශ්‍ය තාව නූතන ලෝකයට අවශ්‍ය වී තිබේ. බෞද්ධ සම්ප්‍රදාය තුළ මෙම අවශ්‍යතාව මතු වූයේ එහි ආරම්භයේ පටන් බව පෙනීයයි. විශේෂ යෙන් බුද්ධ දේශනා ආරක්ෂා කිරීම හා කටපාඩම් කිරීම එවැනි ග්‍රන්ථවිඥාපන ක්‍රම අනුගමණය කිරීමට හේතු වන්නට ඇත. කෙසේ වෙතත් ඉතිහාසය පරීක්ෂා කිරීමේ දී මෙවැනි සන්දර්භයකින් දැනුම සංවිධානය කරන ලද වෙනත් අවස්ථාවක් පිළිබඳ තොරතුරු හඳුනා ගත හැකි ද යන්න සැක සහිත ය. නූතන දැනුම සංවිධාන පිළිබඳ ඉදිරිපත් වී ඇති ග්‍රන්ථ විඥාපන ක්‍රම පිළිබඳ දැනුම ඉපැරණි බෞද්ධ ආචාර්ය සම්ප්‍රදායයන් තුළ ක්‍රියාත්මක වෙමින් පැවති බව මෙයින් තහවුරුවේ.

## ග්‍රන්ථනාමාවලිය


අබේනායක, ඔලිවර්, (1983) **විනය පිටකය**, බොරලැස්ගමුව: ප්‍රබුද්ධ ප්‍රකාශකයෝ.

අබේරත්න, සමරකෝන්, (2002) **බෞද්ධ ග්‍රන්ථවිද්‍යාව**, *Journal of the University Library Association of Sri Lanka*, University Library Association of Sri Lanka, vol.6, pp.120-132.

**අංගුත්තර නිකායට්ඨකථා** 1, (2003) පරි. කපිල අභයවංස, කොළඹ: ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතිය.

**ඉතිවුත්තකට්ඨකථා,** (2008) පරි. ඇස්වත්තේ රේවත හිමි, දෙහිවල: බෞ.ස.ම.





**කඞ්ඛාවිතරණී නම් වූ ප්‍රාතිමෝක්ෂ වර්ණනාව**, (2009), පරි. කපිල අභයවංස, දෙහිවල: බෞ.ස.ම.

චන්දවිමල හිමි, රේරුකානේ, (2008) **විනය කර්ම පොත**, පොකුණුවිට: පුස්තක සංරක්ෂණ මණ්ඩලය.

**චුල්ලවග්ගපාළි** 2, (2005) බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා පුනර් මුද්‍රණය, දෙහිවල: බෞ.ස.ම.

**දීඝනිකාය 1**, (2005) දෙහිවල: බෞ.ස.ම.

**දීඝනිකාය 2**, (2005) දෙහිවල: බෞ.ස.ම.

**දීඝනිකාය ටීකා**, (1967) සංස්. හේනේගම කල්‍යානසිරි ථෙර සහ හේන්ගොඩ කල්‍යානධම්මථෙර, කොළඹ: සෝමාවතී හේවාවිතාරණ මුද්‍රණ.

**දීඝනිකායට්ඨකථා 1,** (2008) පරි. දයාගුණසේකර සහ පී.ඇල්.කේ. පෙරේරා, දෙහිවල: බෞ.ස.ම.

**පරිවාරපාළි 1**, (2005) දෙහිවල: බෞ.ස.ම.

ප්‍රඥාසාර හිමි, කිරිවත්තුඩුවේ, (1961) **භාවාර්ථ ධර්ම විස්තර සහිත ඉතිවුත්තක පාළිය**, කොළඹ: අනුල මුද්‍රණාලය.

**භික්ෂු ප්‍රාතිමෝක්ෂය,** (2007) සම්. රඹුක්වෙල ඤාණසීහ හිමි, මහනුවර: සමාධි සංස්කෘතික කේන්ද්‍රය.

**මජ්ඣිමනිකාය 1**, (2005) දෙහිවල: බෞ.ස.ම.

**මජ්ඣිමනිකාය 3**, (2005) දෙහිවල: බෞ.ස.ම.

**මජ්ඣිමනිකායට්ඨකථා 1**, (2008) දෙහිවල: පරි. අදාවල දේවසිරි හිමි, බෞ.ස.ම.

**මහානිද්දෙසට්ඨකථා**, (2008) භදන්තාචරිය උපසෙනථෙර, පරි. හත්තොටුවේ ඉන්ද රතන හිමි, දෙහිවල: බෞ.ස.ම.

**මහාවග්ගපාළි 1**, (2005) දෙහිවල: බෞ.ස.ම.

රණසිංහ, පියදාස (1998) **සංක්ෂිප්ත ඇංග්ලො ඇමරිකානු සූචිකරණ නීති සංග්‍රහය 2**, කර්තෘ, රාගම.

වජිරඤාණ හිමි, හොරණ, (2000) **ලක්දිව විනය සාහිත්‍යය**, කොළඹ: එස්. ගොඩගේ.

විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, (බු.ව. 2498) **ශාසන වංශ ප්‍රදීපය**, මාතර: මාතර වෙළෙන්දෝ.

**සමන්තපාසාදිකා විනයට්ඨකථා 1**, (2009) පරි. අම්බලන්ගොඩ ධම්මකුසල නා හිමි, දෙහිවල: බෞ.ස.ම.

**සංයුත්ත නිකාය 1**, (2005) දෙහිවල: බෞ.ස.ම.




ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
16 JUL 2015
පුස්තකාලය

Cutter, Charles A. (1904) **Rules for a Dictionary Catalog**. 4th ed., rewritten., Government Printing office, Washington, D.C.

Functional Requirements for Bibliographic Records: Final report, Munich: Saur, 1998., IFLA UBCIM publications new series; v. 19, London.

Gandhi, T. M. K.(1995) **Cataloguing: Theory and practice**, New Delhi: Anmol Publication Pvt. Ltd.

ICCP (1963) International Conference on Cataloguing Principles *Report*, IFLA, London.

Kumar, Krishan (1989) **Library manual**, Vikas Publishing House Pvt. Ltd., New Delhi.

Lubetzky, Seymour (1969) *Principles of Cataloging. Final Report. Phase I: Descriptive Cataloging*. University of California, Institute of Library Research, Los Angeles,

Ranganathan, S.R.(1955) **Heading and Canons**, S. Viswanathan, 1955, Madras.

Ranganathan, S. R. (1964) Classified catalogue code with additional rules for dictionary catalogue code, 5th ed., Asian Publication House, Bombay.

Suraj, V.K.(2005) Encyclopaedic dictionary of library and information science, vols.3, Isha Books, Delhi.